01. 'සද්ධර්මරත්නාවලී කතු හිමියන් සිය කතා වස්තූන් ඉදිරිපත් කරනු සඳහා යොදා ගනු ලබන්නේ සියලු දෙනාට වටහා ගත හැකි බණ කතා රීතියයි' නිදසුන් දෙමින් විමසන්න.

සිංහල ගද්‍ය සාහිත්‍යය නම් මහා සරසියෙහි සුපිපි සුගන්ධවත් පද්මයක් සේ එදා මෙදාතුර සුවඳ විහිදුවන මනරම් ගද්‍ය කෘතියක් වශයෙන් සද්ධර්මරත්නාවලිය අද දක්වාත් පාඨක ශ්‍රාවක අවධානය දිනන්නට සමත් වන බව යමෙකු පැවසුවහොත් එහි කිසිඳු වරදක් නැත. සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය සමය වශයෙන් අවිවාදිත දඹදෙණි සමයේ විසූ ධර්මසේන නම් යතිවරයෙකුගේ අතින් විරචිත මෙම මනරම් ගද්‍ය කාව්‍යය පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් ලියැවුණ අපූර්ව බණ කතා පොතකි. 'පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි....' යනුවෙන් කතුවරයා ම දක්වන පරිදි මෙම කෘතියේ දී සිදු ව ඇත්තේ මුල් පාලි මූලාශ්‍රය ඇසුරු කිරීම ම පමණකි. මුල් කතා පුවත කියවා තම අභිමතය පරිදි නැවත කතා පුවත ප්‍රතිනිර්මාණය කරන ධර්මසේන හිමියෝ සිය ස්වාධීනත්වය මුලු කෘතිය පුරා බොහෝ තැන්වල දී මතු කර ගන්නට සමත් වෙති. කතාව ඉදිරිපත් කිරීම සඳහා කාටත් වැටහෙන ධර්ම සභාවක ධර්ම දේශනාවක් ඉදිරිපත් කරන බණකතා ශෛලිය තෝරා ගැනීම ද එකී ස්වාධීනත්වයේ ම ලක්ෂණයකි. සිය ග්‍රාහක සමාජය වියත් පණ්ඩිතයන්ගෙන් ගහණ නො වූ අවියත් සරල මිනිසුන්ගෙන් සැදුම් ලැබූවක් බව දන්නා ධර්මසේන හිමි ඔවුනට වැටහෙන සේ කතාව කියන්නට ඒ යෙදූ උපාය මෙම කෘතිය අද දක්වාත් ජීවමාන ව පවතින්නට ප්‍රබල හේතුවක් විය. මේ තත්ත්වය සද්ධර්මරත්නාවලියේ කුමනාකාරයේ කතා පුවතක් විමසුව ද පැහැදිලි වන්නේ ය. සාමාන්‍ය පෙළට නිර්දිෂ්ට උග්ගසේන සිටුපුත්හුගේ කතා පුවත ඇසුරෙන් වුව එය විමසා බැලිය හැකි ය.

උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුව ඇරඹෙන්නේ පොදුවේ සද්ධර්මරත්නාවලියේ අන් සෑම කතා පුවතක් ම ඇරඹෙන්නාක් මෙන් කතා ආරම්භයේ දී ම කතා පුවතෙන් කියැවෙන ධර්ම උපදේශනය හකුළුවා ඉදිරිපත් කරමිනි.

"තව ද උගනිතත් නිරවද්‍ය ශිල්පයක් මුත් සාවද්‍ය ශිල්පයෙන් ඓහලෞකික ප්‍රයෝජනයක් මුත් පාරලෞකික ප්‍රයෝජනයක් නැති නියාව හඟවන්නට....."

ධර්මසේන හිමියන් සිය කතා පුවත් හරහා සෘජුව ම ඉලක්ක කරන්නේ සාමාන්‍ය ජනයාව ය. සාමාන්‍ය ජනයාට බණක් දෙසන ශෛලිය සිය කතා වස්තු ඉදිරිපත් කරන්නට ද උන් වහන්සේ තෝරා ගන්නට ඇත්තේ ඒ නිසා ය. සාමාන්‍ය ජනයා යනු මහා පණ්ඩිතයෝ නො වූහ. කතාවක සඟවන පණිවුඩයක් තෝරා බේරා ගන්නට තරම් ඔවුහු විවේක බුද්ධිය ඇත්තෝ ද නො වූහ. කතාකරුවා ම පිවිස කතාවේ පණිවුඩය මේ යැයි පවසන්නේ ඒ නිසාවෙනි. මෙය ධර්ම සභාවකට වැඩම කර ධර්ම දේශනාවක් අරඹන ධර්ම දේශක භික්ෂුවකගේ ද ලක්ෂණයයි. උන් වහන්සේලා ද සිය බණ දෙසුම අරඹන්නට ප්‍රථමයෙන් එදිනට නියමිත ධර්ම දේශනය කුමක් පිණිස දැයි නිශ්චිත ව දක්වති. ඒ ශ්‍රාවකයන් වැඩි අවධානයෙන් අසා සිටිය යුත්තේ, කුමක් දැන ගනු සඳහා දැයි පැහැදිලි ව දක්වා ශ්‍රාවක අවධානය පහසුවෙන් පවත්වා ගැනීමට ය. ධර්මසේන හිමි ද ඒ උපාය ම ඒ අරමුණින් ම යොදමින් උග්ගසේන කතා පුවත කියැවිය යුත්තේ 'මෙලොවට වැඩදායි ශිල්ප නො ව පරලොවට ම වැඩදායි ශිල්ප ම ඉගෙනිය යුතු' යැයි දැනුවත් වීමට බව කියමින් මෙම කතා ආරම්භයේ දී ම තම කතා කලාව බණ කතා කලාවක් බව තහවුරු කර ගන්නට සමත් නිදර්ශනයක් සපයන්නේ වෙයි.

අවස්ථාවක් රසවත් කර වඩා විස්තරාත්මක ව පැහැදිලි කරන්නට උපමා භාවිතා කිරීම ද ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ දැකිය හැකි වන සුවිශේෂ ලක්ෂණයකි. උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුව තුළ ද එම තත්ත්වය දැක ගත හැකි ය.

සැකසුම - කසුන් වර්ණකුලසූරිය (සිංහල විෂය භාර ආචාර්ය)

පු/ විද්‍යා චක්‍රවර්ති මහා විද්‍යාලය

"අවකප්පනයෙන් සැදු හසු රැන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ"

ධර්ම සභාවක දේශනා කරන ධර්ම කථිකයෙකු සිය ශ්‍රාවකයන්ට වඩාත් හොඳින් අවබෝධ විය යුතු දෑ වැටහෙන්නට ඉඩ හසර සකසන්නට උපමා යොදා ගන්නා පරිද්දෙන් ධර්මසේන හිමියෝ ද උපමා යොදමින් සිය කතාව කියති. ඒ බව ඉහත උපුටා දැක්වුණ නිදසුනෙන් ම පැහැදිලි වන්නේ ය. උග්ගසේන සිටු පුත්‍රයා සිය බිරිඳ වූ විද්දත් දියණියගේ බැණුම් - අපහාස අඩු කර ගන්න යැයි සිතා ඈ බිය වද්දන්නට ගොස් ඇගේ ගැරහුම් තව තවත් වැඩි වී ගිය අයුරු මෙම අවස්ථානුචිත උපමාවෙන් කදිමට විස්තර කෙරෙන්නේ වෙයි. එය කතාකරුවාගේ අපූර්ව කතා කීමේ උපායකි. ධර්ම සභාවේ වාඩි වී පණ්ඩිත භික්ෂුවක විසින් කියවනු ලබන කල්හි ඒ අසා රස විඳින ලොකු කුඩා කාටත් එකී අවස්ථාව රසවත් ව මවා ගන්නට ඉඩ සකසන උපායකි. ධර්ම දේශනා ශෛලියෙන් උකහා ගෙන තමන්ගේ කතා කීමේ කලාව තුළට කතු හිමියන් එක් කර ගන්නා මෙම උපක්‍රමය නිසා ධර්මසේන හිමියන්ගේ කතා කලාව සියලු දෙනාට වැටහෙන බණ කතා කලාව යැයි නැවතත් තහවුරු වන්නේ ය.

අවශ්‍ය තැන ධර්මය විස්තර කර දීම ද ධර්මසේන හිමියන්ගේ කතා කලාව තුළ දැකිය හැකි ය. උග්ගසේන කතා පුවතේ ආ පහත නිදසුන විමසන්න.

"උග්ගසේනයෙනී, කෙළි ළඑවෙහි ඇලුම් තබා ලා ගිය දවස පැවති පස් කදෙහි ආලයත් හරුව...."

ධර්මසේන හිමි කතාන්දරකාරයෙක් නො වේ. උන් වහන්සේ ධර්ම දේශකයෙකි. ධර්මය පහසුවෙන් ග්‍රහණය කර වන්නට කතාවක් යොදා ගත්තා මිස කතාවක් කියා සහෘදයන් පිනවා ලෞකික පිනවීමක් ඔවුන් වෙත ප්‍රදානයට උන් වහන්ස්ගේ සූදානමක් නැත. උන් වහන්සේ කතා ලියන්නේ බණ කීමට ය. මේ එකී බණ හෙවත් ධර්ම පණිවුඩය උග්ගසේන කතා පුවතෙන් මතු වන තැනයි. ශරීරය කෙරේ ඇති ආශාවෙන් මිදුණෙකුට පහසුවෙන් ජාති - ජරා - ව්‍යාධි - මරණ යන චක්‍රයෙන් මිදිය හැකි බවට උපදෙස් දෙන තැනයි. මෙය ද උන් වහන්සේගේ කතා කලාවේ මතු ව එන ප්‍රබල ලක්ෂණයකි. කතාව කියා ගෙන යන අතර දහම් පණිවුඩයක් දිය හැකි තැනක් දුටුවහොත් උන් වහන්සේ එය ධර්ම දේශනාවක නිරත ධර්ම කථික භික්ෂුවක එවන් අවස්ථාවක් අත් නො හරින්නා සේ ම අත් නො හරිති. එය උන් වහන්සේගේ කතා කලාව බණ කතා කලාවකැයි දෙස් දෙන්නට ද හේතුවකි.

මෙතෙක් දක්වන ලද කරුණු අනුව ධර්මසේන හිමියන් සිය කතා පුවත් ඉදිරිපත් කිරීම සඳහා යොදා ගෙන ඇත්තේ අවියත් සාමාන්‍ය ජනයාට පවා පහසුවෙන් ග්‍රහණය කොට රස විඳිය හැකි ධර්ම දේශනා ශෛලිය හෙවත් බණ කතා රීතිය ම බව පැහැදිලි වෙයි.

සැකසුම - කසුන් වර්ණකුලසූරිය (සිංහල විෂය භාර ආචාර්ය)
පු/ විද්‍යා චක්‍රවර්ති මහා විද්‍යාලය